**ශීර්ෂය 256 ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| (i) 2.4 ඡේදය | පරීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව අයකිරීමට කටයුතු කළ යුතු අතර , අයකිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.නව පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | 2.5 (i) |
| (ii) 5 (ඈ) ඡේදය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතුය. | 5 (ඈ) |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය බව දැනුම් දීමට ප්‍රමාදවීම, විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවීම සහ වෙනත් හේතූන් මත ගම්පහ දිස්ත්‍රික්කය තුල ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 මගින් 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයින් 402 දෙනෙකු සඳහා එකතුව රු. 38,300,144 ක ප්‍රමාණයක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවනලද මුදල් සැහෙන ප්‍රමාණයක් අයකරගෙන ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | *වැඩිපුර ගෙවීම් කඩිනමින් ආපසු අයකරගත යුතුයි.<br>*වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| VII පරිච්ඡේදය 12.2.3 වගන්තිය | | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 තුල ග්‍රාම නිලධාරීන් 202 දෙනෙකු මාස 02 සිට වසර 09 දක්වා කාලයක් වැඩ බැලීම් කර තිබුණි. | දැනට සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන් විශ්‍රාම ගැනීම , දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීම මත පුරප්පාඩු ඇතිවේ. 2018 වර්ෂයෙන් පසුව ග්‍රාම නිලධාරී තනතුරට නව බඳවාගැනීම් සිදු නොවීම මත පුරප්පාඩු සම්පූර්ණ වී නොමැත. එම නිසා සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන් වැඩබැලීම සඳහා පත්කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළයුතු බව. |

## 2.3 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 ජුලි 15 දින සිදු වූ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාරව පැවති අවසන් පරීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශිය ලේකම්, ගණකාධිකාරි, මුදල් | 2014 ජුලි 14 දින මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ වාර්තාවට අනුව වගකිව යුතු නිලධාරීන් හතර දෙනාගෙන්ම මධ්‍යම රජයට සිදුවූ අලාභය සම්බන්ධයෙන් රු.32,247.14 බැගින් අයකරගැනීම සඳහා 2021 | පරීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව අයකිරීමට කටයුතු කළ යුතු අතර , අයකිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. නව පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු බව. |

සහකාර සහ සරප් යන නිලධාරින්ගෙන් සමානව රු.270,561 බැගින් අයකර ගත යුතු බවට නිර්දේශ කර තිබූ අතර 2020 සැප්තැම්බර් 22 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් අදාල අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය පවා ලබා දී තිබුණ ද මුදල් නැතිවීම සිදුවී වසර 8 කට වඩා කාලයක් ගතවී තිබුණද අදාළ අයකිරීම් සිදුකර නොතිබුණි. අලාභ මුදල් අයකර ගැනීමේදී ඒ සඳහා අකමැත්ත පළ කිරීම සාමාන්‍ය ස්වභාවය වන අතර මෙහිදී ද නිලධාරීන් සිව් දෙනාම අකමැත්ත ප්‍රකාශකර තිබීම මත යථෝක්ත මුදල් නැතිවීම හා ඊට වගකිව යුතු අය නිශ්චය කිරීම පිළිබඳ පරික්ෂා කිරීම සඳහා නැවත ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2022 අප්‍රේල් මාසයේදී නව පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. ඒ අනුව මුදල් අතුරුදහන් වීම නිසා විශාල අලාභයක් රජයට සිදු වී තිබුනද තවදුරටත් නව පරීක්ෂණය සඳහා නිෂ්ඵල ලෙස මුදල් වැය කිරීමට කටයුතු කර තිබුණි.

නොවැම්බර් 01 දිනැතිව ලිපි මගින් ඔවුන්ට දැනුම්දී ඇත. නැවත ඉහත සමාංක හා 2021 දෙසැම්බර් 14 දිනැතිව බස්නාහිර පළාත් සභාවට අයවිය යුතු අලාභය වෙනුවෙන් රු.228,946.50 බැගින් ගෙවන ලෙස ඔවුන්ට දැනුම්දී ඇත. නමුත් අදාළ වගකිව යුතු නිලධාරීන් සියලු දෙනාම අලාභය හානි පූර්ණය කිරීම සඳහා කිසිදු එකගතාවක් නොමැති බැවින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක F/DA/06/WRI02/003 හා 2022 පෙබරවාරි 10 දිනැති ලිපියට අනුව නව පරීක්ෂණ මණ්ඩලයක් මගින් මු.රෙ.104 (1)(ආ) ප්‍රකාරව නැවත පරීක්ෂණයක් පැවැත්වීමට මණ්ඩලය නම්කර අනුමැතිය සඳහා 2022 මාර්තු 22 දිනැතිව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙතට ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශ ලේකම් විසින් නව පරීක්ෂණ මණ්ඩලය පත්කිරීමට ලබාදුන් අනුමැතිය මත දිලේ/P/1/16 හා 2022 අප්‍රේල් 08 දිනැතිව නව පරීක්ෂණ මණ්ඩලයට දන්වා ඇත. තවද මාස 03 ඇතුලත වාර්තාව ලබාදෙන ලෙස දන්වා ඇත.

| | | | |
|---|---|---|---|
| (ii) | මිණුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ කළමනාකරණ සහකාර වරියක මහජනාධාර මුදල් වංචා කිරීම මත රු.1,400,429 ක මුදලක් අයකර ගැනීමට තිබූ අතර එම මුදලින් රු.39,480 ක මුදලක් 2022 ජුලි 28 දින ගෙවා තිබුණ ද. ඉතිරි මුදල ඉතාම කඩිනමින් අයකරගැනීමට හෝ නිලධාරියාට එරෙහිව නීතිමය පියවර ගැනීම කෙරෙහි වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | එම නිලධාරිණිය 2023.07.23 දින විශ්‍රාම යාමට නියමිත බැවින් රජයට අයවිය යුතු රු.1,430,428 ක මුදල , අදාල නිලධාරිනිය විශ්‍රාම යන දින දක්වා ඇයගේ මාසික වැටුපෙන් 40% ක මුදලක් අය කිරීම හා තවදුරටත් ගෙවීමට ඉතිරිවන මුදල ඇයගේ පාරිතෝෂිත මුදලින් අයකිරීමට සුදුසු බව නිර්දේශකර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. | අයකිරීම් කඩිනමින් කල යුතු බව. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් ආපදා ණය සහ වෙනත් ණය ලෙස 2022 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,666,806 ක් විය. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 5 ට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණද එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමේදී අධිකරණ කටයුතු ආදිය ඇතොත් මිස අනෙකුත් නිලධාරීන්ගෙන් හැකිතාක් ණය ශේෂ අයකරගැනීමට කටයුතු කර ඇත.මෙම වසරේ සැලකිය යුතු ශේෂයක් අයකරගෙන ඇති අතර ඉතිරියද අයකර ගැනීමට බලාපෙරොත්තු වේ. | අයකර ගතහැකි විකල්ප ක්‍රියාමාර්ග වලින් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බව |

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රදවා ගන්නා ලද රැදවුම් තැන්පතු ගිණුම් අවස්ථා 14 කදී තැන්පත් කරන ලද, වර්ෂ 02 කට වඩා කල් ඉකුත් වූ වටිනාකම රු.84,451,384 ක් වූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ 02 කට වැඩි තැන්පතු ශේෂ 2023 වර්ෂය තුල හැකිතාක් නිරවුල් කිරීමට බලාපොරොත්තු වේ. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම ආරම්භ කරන ලද නිල සෙවන කාර්යාල 06 ක සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අත්තිවාරම පමණක් දමා තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද මෙම නිල සෙවන කාර්යාලයන් සඳහා ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන නොලැබීම මත සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | මිනුවන්ගොඩ නාලන්දා පිරිමි පාසලෙහි නල ළිදක් ඉදිකර ජල පොම්පාගාරයක් සවිකර පානීය ජලය ලබා දීම සඳහා රු.800,714 ක වියදමක් දැරීමෙන් පසු ව්‍යාපෘතිය මුළුමනින්ම අතහැර දමා තිබීම හේතුවෙන් එම මුදල් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ජල සාම්පල් පරීක්ෂාවෙන් පසුව කඩිනමින් නලළිඳ භාවිතයට ගැනීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළයුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ - 2021 වර්ෂයේ දී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මාකෙවිට ප්‍රදේශයේ රු.1,875,525 ක් වියදම් කර ඉදිකර තිබූ අලෙවි මධ්‍යස්ථාන 06 භාවිතයට ගැනිමට සුදුසු මට්ටමට වැඩ අවසන් කර නොතිබූ බැවින් වැයකළ මුදලට මෙතෙක් ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | අලෙවි කුටි ඉදිකිරීම සඳහා 2021.11.15 දින ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කර ඇත.2021.12.28 දිනට අවසන් වී ඇති වැඩ සඳහා එම මුදල් යොදවා ඇත. මෙම වර්ෂයේ අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හා අමුද්‍රව්‍ය වෙළඳපොලේ හිඟ වීම ආදී කරුණු හේතුවෙන් සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකි වී ඇත.වැඩ අවසන් කිරීමට 2022 වර්ෂයේදීද ප්‍රතිපාදන ලැබී නැත. | ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඉදිරියේදී ඇතිවිය හැකි නියඟ කාලවලදී පීඩාවට පත්වන ජනතාවට ජලය සැපයීම සඳහා රු.547,134 ක වියදමක් දරා කැණීම් කටයුතු පමණක් සිදුකළ නල ළිං 07 ට පොම්ප සවිකිරීමේ කටයුතු කර නොතිබීම නිසා වතුර ගැනීමට අපහසු වීමෙන් වසර 03 කට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබූ අතර ඒ වෙනුවෙන් වැයකර තිබුණි. | නළ ළිං භාවිතයට ගතහැකි තත්වයට පත් කිරීමට ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළයුතු බව. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------- | ----------------- |
| (අ) ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා මහල් 07 කින් යුත් පිරිවැය ඇස්තමේන්තුව රු.3,054,216,427 ක් වන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත භාර දී තිබූ අතර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2021 මාර්තු 01 දින වන විට අවසන් කළයුතු බව සඳහන් කර තිබුනද 2022 මැයි 31 දිනැති රාජ්‍ය පරිපාලන | කොවිඩ් වසංගතය හේතුවෙන් රටේ ඇති වූ ආර්ථික අර්බුදය ඉදිකිරීම් කටයුතු වලට විශාල බලපෑමක් ඇති වූ අතර පවතින තත්වය සඳහා බලාපොරොත්තු කාලය දීර්ඝ කිරීම සිදු කර ඇති අතර ,දැනට ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතී. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| අමාත්‍යංශ ලේකම්ගේ ලිපිය අනුව වැඩ අවසන් කළ යුතු දිනය කාර්යාල ගොඩනැගිල්ල සඳහා 2022 මැයි 29 හා ශ්‍රවනාගාරය සඳහා 2022.ජූලි 18 ලෙස සඳහන් කර තිබුණි.කෙසේ වුවද 2023 මැයි 31 දින වන විටද වැඩ අවසන් කර ගොඩනැගිල්ල භාර දී නොතිබුණි. | | |
| (ආ) ජා - ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනට පවතින ගොඩනැගිල්ල ඉතාම අබලන් තත්වයේ පවතින බැවින් නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම 2013 වර්ෂයේදී ආරම්භ කර රුපියල් මිලියන 165.34 ක ඇස්තමේන්තු මුදලකට කඩිනමින් ඉදිකර අවසන් කිරීමට අපේක්ෂා කලද ඉඩම පිළිබඳ මතුවූ ගැටළුවක් මත ගොඩනැගිල්ලේ පාදම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු.5,369,779 ක අත්තිකාරම් මුදලක්ද ගෙවීමෙන් පසු කොන්ත්‍රාත්තුවේ වැඩ තාවකාලිකව අත්හිටුවා වසරකට ආසන්න කාලයකින් පසු එම ආයතනය මගින්ම රුපියල් මිලියන 27 ක් වැයකර පාදම කොටස ඉදිකරවා ගෙන රුපියල් මිලියන 145.33 වටිනාකමකට ඉතිරි වැඩ කොටස වෙනත් ආයතනයකට පවරා තිබුණි. 2013 වර්ෂයේ දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2021 නොවැම්බර් 18 දින අවසන් කිරීමට නියමිත ව තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ද නිමකර ගැනීමට හැකි වී නොතිබුණි. | දැනට ඉදිකිරීම් ප්‍රගතිය 98% ක සතුටුදායක මට්ටමේ පවතී.2023 වර්ෂය තුල භාවිතයට ගැනීමට බලාපොරොත්තු වන බව දන්වා සිටිමි. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළයුතු බව. |
| (ඇ) වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා මහල් පහකින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට 2013 ඔක්තෝම්බර් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රුපියල් මිලියන 167.9 ක් වන මුළු පිරිවැය ඇස්තමේන්තුවට අනුමැතිය ලැබී තිබූ අතර පළමු අදියර ලෙස පයිලින් වැඩ සිදු කර දෙවන අදියර වශයෙන් ගොඩනැගිල්ල ඉදිකිරීමට තීරණය විය. දෙවන අදියර සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් අනතුරුව පුද්ගලික | දැනට ඉදිකිරීම් ප්‍රගතිය 99% ක සතුටුදායක මට්ටමේ පවතී.2023 වර්ෂය තුළ භාවිතයට ගැනීමට බලාපොරොත්තු වන බව දන්වා සිටිමි. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| | සමාගමක් වෙත රු. 110,999,052 ක වැට් රහිත මුදලකට 2016 දෙසැම්බර් 29 දින කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. මෙම කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි 12 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 28 දින අවසන් කළ යුතුව තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි තත්ත්වයට ඉදිකිරීමේ වැඩ නිමකර නොතිබුණි. | | |
| (ඇ) | මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියාපදිංචි මරණාධාර, ග්‍රාම සංවර්ධන සමිති, අවමංගල්‍යාධාර, කාන්තා, වැඩිහිටි සමිති සඳහා ප්ලාස්ටික් පුටු හා රෙදි ලබා දීම සඳහා 2021 විමධ්‍යගත වැඩසටහන යටතේ , 2021 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.889,283 ක් වටිනා 10*15 කැනපි 21 ක්, ඇඳි සහිත ප්ලාස්ටික් පුටු 274 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බෙදාහැර නොතිබුණි. | ඉදිරියේදී අදාල සියළුම භාණ්ඩ හැකි ඉක්මණින් බෙදා දීමට කටයුතු සිදු කරනු ලබයි. | මහජනයාට සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළයුතු බව. |

### 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වසර 05 තුල ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය රු.1,832,000 ක වියදමක් දරා මොරගොඩ, ඉදිකර තිබූ සේවා පියස සහිත මාතෘ සායන ගොඩනැගිල්ල ,කොස්සින්න නැගෙනහිර ඉදිකර තිබූ සේවා පියස හා මුදුන්ගොඩ උතුර සේවා පියස යන ගොඩනැගිලි 03 භාවිතයට ගත නොහැකි මට්ටමක පැවතියෙන් ඒ සඳහා වැයකර තිබූ මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | භාවිතයට ගතහැකි මට්ටමට වැඩ නිමකිරීම සඳහා තවදුරටත් ප්‍රතිපාදන අවශ්‍ය වේ. | අඩුපාඩු සොයාබලා භාවිතයට ගතහැකි තත්වයට පත් කළයුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | සෞභාග්‍යා පේෂකර්ම ගම්මාන වැඩසටහන, යටතේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් අස්සැන්නවත්ත ඉදිකර තිබූ පේෂකර්ම අලෙවි මධ්‍යස්ථානය, ප්‍රාදේශීය සභාව සතු ඉඩමක ඉදිකර තිබූ අතර අස්සැන්නවත්ත සෙක්කුවත්ත පුස්තකාල ගොඩනැගිල්ලේ උඩුමහලේ මෙම මධ්‍යස්ථානය ඉදිකිරීමට රු. 2,925,909 ක් වැයකර තිබූ නමුත් මෙම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට නොහැකි වීම නිසා 2022 වසරේ ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ රු.1,261,981 ක් වැයකර දෙවන මහලේ වැඩ අවසන් කර උඩුමහල පුස්තකාලය ලෙසත් පහළ මහල අලෙවි මධ්‍යස්ථානය ලෙසත් සකස් කර තිබුණ ද භාවිතයට ගෙන නොතිබුණි. එම තත්ත්වය එසේම තිබියදී අලෙවි මධ්‍යස්ථානය පහත මහලේ තිබීම මත සෝෂාකාරී තත්ත්වය හේතුවෙන් පුස්තකාලය පරිහරණය කරන්නන්ට නිරවුල් මනසකින් පොත්පත් කියවීමට නොහැකි තත්වයක් උදාවී ඇත. | ව්‍යාපෘතිය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ඇත. කුරුණෑගල-කොළඹ ප්‍රධාන මාර්ගයට ආසන්නතම ජනාකීර්ණ ස්ථානයක මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති අතර පුස්තකාලය ඉහළ මහලේ පවත්වාගෙන යනු ලබයි. මේ වන විට රටේ පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් නිෂ්පාදකයින් බොහෝමයක් අලෙවිය සඳහා ප්‍රමාණවත් නිෂ්පාදනයක් නොකිරීම නිසා මේ වන විට අලෙවි මධ්‍යස්ථානය ක්‍රියාකාරී තත්ත්වයේ නොමැත. | අලෙවි මධ්‍යස්ථානය ක්‍රියාකාරී තත්වයට පත් කළ යුතුබව. |
| (ඇ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ 2021 වර්ෂයේ බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන් 10 දෙනෙකුට ලබාදුන් ලීටර 1000 වතුර ටැංකි 10 හා අඩි 100 හෝස් 10ක් භාවිතයට ගෙන නොතිබුණි. | සුබ සාධක සමිතියේ ඉල්ලීම පරිදි අහලේ වතුර බට ලබා දී ඇති බව. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළයුතු බව |
| (ඈ) | බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදනය ගම්මාන වැඩසටහන - 2021 ව්‍යාපෘතියෙන් පූජා භාණ්ඩ නිශ්පාදනය සඳහා රු.633,245 ක් වැයකර ප්‍රතිලාභීන් 06 දෙනෙකුට ලබාදුන් උපකරණ ඔවුන් විසින් භාවිතා කර නොතිබීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කල අරමුණු ඉටු වී නොතිබුණි. | ෆැරපින් ඉටි ලබාගැනීමේ නොහැකියාව මත ඉටිපන්දම් නිෂ්පාදනය නොකරන නමුත් පහන් තිර නිෂ්පාදනය සිදු කරයි. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළයුතු බව. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට වාහන අමතර කොටස් මිලදීගැනීම් අවස්ථා දෙකකදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) විධි විධාන වලට පටහැනිව ආයතනයේ ලියාපදිංචි සැපයුම්කරුවන් සිටියදී එම ලැයිස්තුවෙන් පරිබාහිර පුද්ගලයින්ගෙන් මිළ ගණන් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය . | අදාල ගොණුවේ 50 ලිපිය මගින් 2020.02.07 මිළ ගණන් කැඳවා ඇති අතර දිස්ත්‍රික් ලේකම්ගේ නියෝග හා අනුමැතිය පරිදි අදාල උපාංග සවිකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළයුතු බව. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීරිගම හා ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ආපදා අංශය සතු ට්‍රැක්ටර හා බවුසර 2 ක් හා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේහි ආපදා අංශය සතු ට්‍රැක්ටර හා බවුසර 9 ක් ද, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේහි ආපදා අංශය සතු ට්‍රැක්ටර හා බවුසර 3 ක් ද වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට ඵලදායී කාර්යයකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ප්‍රමාණවත් රියදුරන් නොමැති වීම හා අනෙකුත් බවුසර් ජලය බෙදාහැරීමට ප්‍රමාණවත් වූ බව. | වත්කම් ඵලදායී, කාර්යක්ෂමව යොදා ගත යුතු බව. |
| (ආ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් පරිශ්‍රයේ 2020 වර්ෂයේ රු.1,000,000 ක ප්‍රතිපාදන මත ඉදිකරන ලද ජල ටැංකිය සඳහා ජලය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීමෙන් එකී ජල ටැංකියද, | නළ ලිං වල වර්තමාන තත්ත්වය පිළිබඳ විමසා 2023.03.09 දින ලිපියක් ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | අවශ්‍ය ජලපොම්ප හා නල පද්ධතිය සපයා ජලටැංකිය භාවිතයට ගතහැකි තත්වයට පත් කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| | 2018 වර්ෂයේ කැනීම් කර තිබූ, නල ළිඳ ද භාවිතයට ගෙන නොතිබීමෙන් ඒවා ඉදිකිරීමට හා කැනීමට වැයකර ඇති මුදල නිෂ්ඵල වියදම් බවට පත්වී තිබුණි. | | |
| (ඇ) | බුලත් අපනයන වැඩ සටහන යටතේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 45 කුලීගෙදර ප්‍රදේශයේ රු. 2,926,000 ක් වැයකර බුලත් ගබඩාවක් හා අලෙවි මධ්‍යස්ථානයක් 2021 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව සතු ඉඩමක ඉදිකර තිබුණ ද එම ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබීමෙන් ඒ සඳහා වැයකර ඇති මුදල් නිෂ්ඵල වියදම් වී තිබුණි. | ගොඩනැගිල්ල සඳහා ජලය හා විදුලිය ලබා ගැනීමේ ගැටළු පැවතීමත් අලෙවිය සඳහා ප්‍රමාණවත් අස්වැන්නක් නොමැති වීමත් , ගොඩනැගිල්ල භාවිතා නොකිරීමට හේතු විය. වගාවන් යථාතත්වයට පත්වූ පසු ඉදිරියේදී භාවිතයට ගැනීමට හැකි වනු ඇත. | වත්කම් ඵලදායී ව හා, කාර්යක්ෂමව යොදාගතයුතු බව. |
| (ඈ) | 2022 වර්ෂයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, සෞභාග්‍යා පේෂකර්ම ගම්මාන වැඩසටහන යටතේ ඉදුරාගාර ග්‍රාම නිලධාරී වසමේ රු.1,924,944ක් වැයකර ඉදිකර ඇති පේෂකර්ම මධ්‍යස්ථානය භාවිතයට ගෙන නොතිබුණි. | මෙම වැඩසටහන යටතේ ඉදිකර ඇත්තේ අලෙවි මධ්‍යස්ථානයක් නොවන අතර එය නිෂ්පාදන කාර්යයන් සඳහා භාවිතා කිරීමට පේෂ කර්මාන්ත මධ්‍යස්ථානයකි. රටේ පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් මේ වන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොමැත. | වත්කම් ඵලදායී ව හා, කාර්යක්ෂමව යොදාගතයුතු බව. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව විධායක නිල නිවාස 14 ක් ද, විධායක නොවන නිල නිවාස 14 ක් ද ඇති අතර , විධායක නිලනිවාස 14 න් 9 ක් ද විධායක නොවන නිල නිවාස 14 න් 8 ක් ද භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය. | ඉදිරියේදී අදාල නිල නිවස අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට බලාපොරොත්තු වේ. | වත්කම් ඵලදායී ව හා, කාර්යක්ෂමව යොදාගත යුතු බව. |
| (ඊ) | දොමේප් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පාසල් 08 ක් වසාදමා තිබූ අතර එයින් පාසල් 04 ක් ඵලදායී කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. | පාසල් 03 ක් පිහිටි ඉඩම් වල හිමිකාරීත්වය රජයට පවතී ද යන්න තහවුරු කිරීමට තොරතුරු නොමැත. පාසල් දෙකක පවතින ගොඩනැගිලි වලින් කොටසක් අළුත්වැඩියා කර භාවිතා කරනු ලබයි. | වත්කම් ඵලදායී ව හා, කාර්යක්ෂමව යොදාගතයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (උ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු උපලේඛනගත නිලනිවාස 03 න් එක් නිල නිවසක් විධායක නිල නිවසක් වන අතර අනෙක් නිල නිවාස 02 ක විධායක නොවන නිවාසයන් වේ. මෙම නිල නිවාස 03 හි පිරිවැය හෝ තක්සේරු වටිනාකම ලබාගෙන ගිණුම් ගතකර නොතිබුණි. | තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | වත්කම් තක්සේරුකර ගිණුම්ගත කළ යුතු වීම |
| (ඌ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් හෝ ප්‍රාදේශීය ලේකම් බලධාරීත්වය යටතේ ඉදිකරන ලද සේවා පියස/ නිල සෙවන කාර්යාලයන්ගෙන්, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි 04 ක් ද දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි 24 ක්ද වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පිරිවැය හෝ තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරනු ලැබේ. ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | වත්කම් තක්සේරුකර ගිණුම්ගත කළ යුතු වීම |

## 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------------- | ------------------ |
| (අ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් 2017/07/19 දිනැති ලිපියෙන් ආපදා අංශය සතු ට්‍රැක්ටර් බවුසර් 03 බදුල්ල දිස්ත්‍රික්කයේ උමා ඔය ව්‍යාපෘති කටයුතු සඳහා මුදා හැර තිබුණි . 2018 අප්‍රේල් 05 දින ට්‍රැක්ටර් බවුසර 3 ආපසු ලබා දී තිබුණ ද, සුදු යකඩ බද දෙපසම දැඩි ලෙස තැලීමකට ලක්වීම සංඥා ලාම්පු විනාශ වීම , අමතර උපාංග අස්ථාන ගත වීම වැනි විශාල හානියක් සිදු වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර ඒ පිළිබද ලොග් පොත් වල කිසිදු සටහනක් දක්වා නොතිබුණි. 2018 වර්ෂයේ මෙම අලාභය සිදුවී ඇතත්, මුදල් රෙගුලාසි අනුව කටයුතු | උමා ඔය සඳහා බවුසර් රථ මුදා හරිනු ලැබුයේ ගම්පහ දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් මත වන අතර එම රථ නැවත භාර දීමේදී අදාල රථ වල සිදු වී තිබූ අඩුපාඩු පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත ලිඛිතව දැනුම් දී ඇත. තවද 2023.01.03 දිනැතිව මේ සම්බන්ධව නව වියදම් ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස | අලාභය අයකරගැනීම සඳහා කටයුතු කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| | කර වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇති බවද ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බවද කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථය 1999 ජූලි මස අනතුරට පත්වීමෙන් සිදු වී තිබූ අලාභයෙන් රක්ෂණයෙන් අයකර ගත නොහැකි අලාභය වූ රු.189,360 ක් එකී අනතුරට අදාලව සිදුකරන ලද ප්‍රාරම්භක වාර්තාවේ නිර්දේශ අනුව අනතුර සිදු කළ වෑන් රථයේ රියදුරුගෙන් අයකර ගැනීම සඳහා නෛතික කටයුතු ආරම්භ කර ඇතත් 2022 දෙසැම්බර් 31 දින වන විට වසර 24 කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාළ අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | නඩු කටයුතු අසාමාන්‍ය ලෙස ප්‍රමාද වී ඇති බැවින් නීතිපති සහය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට මීණුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් දැණුවත් කර ඇත. | වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් මු.රෙ.156 (1) ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඇ) | 2021 ඔක්තෝබර් මස 20 දින ගම්පහ දිස්ත්‍රික් මෝටර් රථ කාර්යාලයට අයත් සංඥා කුළුන කඩා වැටීම නිසා මුදල් රෙගුලාසි 104(4) යටතේ සිදුකරන ලද අලාභයන් පිළිබඳ පරීක්ෂණ අවසන් වාර්තාව අනුව සැලසුම් අංශ ගොඩනැගිල්ලට හා එහි උපකරණවලට සිදුවී තිබූ අලාභය රු.861,938 ක් විය. මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාර විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කිරීම ගම්පහ දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කර තිබුණු අතර අදාළ කටයුතු පමාවීම හේතුවෙන් මෙම අලාභය අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි . | අලාභය නොගෙවන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව දන්වමින් ලංකා බෙල් ආයතනය වෙත දන්වා ඇත. | අලාභය අයකර ගැනීම සඳහා කටයුතු කළයුතු බව. |
| (ඈ) | මිට්ෂුබිසි කැබ් රථයක් 2022 වර්ෂයේ ඔක්තෝම්බර් 06 දින පස්යාල රත්මලේවත්ත අතිරේක දිස්ත්‍රික් ලේකම් නිවසේ සිට ඉන්ධන ලබා ගැනීමට පස්යාලට පැමිණ නැවත නිවසට යාමේදී රථය රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව දුරකථන රැහැන් කණුවක හා කොන්ක්‍රීට් කණුවක ගැටීමෙන් අනතුර සිදු වී තිබුණි. ඉහත අනතුර හේතුවෙන් | දැනට මූලික විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. එම පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසු ඉදිරි කටයුතු කිරිමට බලාපොරොත්තු වේ. | අලාභය අයකර ගැනීම සඳහා කටයුතු කළයුතු බව. |

රථයකට රු.9,000,000 ක මූල්‍ය අලාභයක් සිදුවී තිබූ අතර රු.6,710,000 ක් රක්ෂණ ආයතනයෙන් ආවරණය කිරීමට එකඟවීමෙන් පසු රු.2,290,000 ක ශුද්ධ මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි.

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2022 ප්‍රකාරව විශ්‍රාම වැටුප් කිහිපයක් හෝ විශ්‍රාම වැටුප සමග වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපක් හෝ ලැබුව ද, එවැනි තැනැත්තෙකුට හිමිවන්නේ මසකට එක් රු.5,000 දීමනාවක් පමණක් වුවත් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවැනි විශ්‍රාමිකයින් දෙදෙනෙකුට දීමනාව දෙවරක් ගෙවීම් කර තිබීම මත මාසිකව රු.5,000 බැගින් මාස 10 ක් සඳහා රු.100,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකිරීම සඳහා දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට සටහන් කර ඇති බව දන්වමි. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගතයුතු බව. |
| (ආ) | 2020 සැප්තැම්බර් 18 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 16/2020 හි 10 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් මාස 04 කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් , සහකාර ප්‍රාදේශීය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන් කරගෙන පරීක්ෂාවට ලක් කළ යුතු වුවත් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 151 න් කාර්යාල 111 ක් ද, මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 39 න් කාර්යාල 37 ක් ද , දොම්පෙ ප්රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 133 න් කාර්යාල 5 ක් ද, මිණුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල | 2022 වර්ෂය තුළ කොරෝනා වසංගතය, ඉන්ධන අර්බුදය වැනි හේතූන් මත සිදුවූ ප්‍රවාහන අපහසුතා මත කාර්යාල පරීක්ෂා කිරීම විධිමත්ව ඉටුකිරීමට නොහැකි විය. 2023 වර්ෂය තුල කාර්යාල පරීක්ෂාව විධිමත්ව සිදු කිරීමට අදාල නිලධාරීන් දැණුවත් කරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| | 121 න් කාර්යාල 42 ක් ද ,වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 46 න් කාර්යාල 18 ක් ද, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 123 න් කාර්යාල 121 ක් ද 2022 වර්ෂය තුල එක් වරක්වත් පරීක්ෂාවට ලක් කර නොතිබුණි. | | |
| (ඈ) | ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි සිටින පවුල් අතරින් අනවසර නිවාස තුළ ජීවත් වන පවුල් 52,946 ක් ද, තාවකාලික නිවාස වල ජීවත් වන පවුල් .24,526 ක් ද ,වැසිකිලි පහසුකම් නොමැති පවුල් 46,818 ක් ද , පොදු ජල කරාම භාවිතා කරන පවුල් 34,634 ක් ද , විදුලිය නොමැති නිවාස 2,432 ක් ද , මාර්ග පහසුකම් නොමැති නිවාස 1,719 ක් ද , වශයෙන් ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකමක්වත් නොමැතිව ජීවත් වන පිරිස පිළිබඳව රජයේ අවධානය යොමුකර එම පවුල්වලට ජීවත්වීම සඳහා මූලික පහසුකම් ලබාදීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය කරමි. | ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පවතින ආර්ථික සමාජීය හා සංස්කෘතික ආදී සෑම අංශයකම පවතින ගැටළු හඳුනා ගෙන අඩුපාඩු නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරු වෙත දන්වා ඇත. | අවම පහසුකම් නොමැතිව සිටින අය නගා සිටුවීම සඳහා විශේෂ අවධානය නැවත යොමු කළයුතු බව |
| (ඇ) | මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 01-756370 හා 21-75155 යටතේ සිවිල් හා වැන්දඹු විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයෙකු 2020 ඔක්තෝබර් 22 දින මිය ගිය ද විධිමත් පරිදි දත්ත පද්ධතියෙන් ඉවත් නොකිරීම හේතුවෙන් මියගිය දිනෙන් පසු සිවිල් විශ්‍රාම වැටුප ලෙස රු.254,468 ක්ද වැන්දඹු විශ්‍රාම වැටුප වශයෙන් රු.133,632 ක මුදලක්ද ගෙවා තිබුණි. මෙම විශ්‍රාමිකයා මියගිය බව ග්‍රාම නිලධාරී විසින් දැනුවත් කර තිබියදී විශ්‍රාම වැටුප නැවැත්වීමට කටයුතු කර නොතිබූ අතර අවිධිමත් ලෙස ගෙවීම් කර තිබූ රු.388,100 ක මුදල අයකර ගැනීමට හෝ එකී වැරදි ගෙවීම වැලැක්වීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල වාරික වශයෙන් උරුමකරු විසින් ගෙවීම සිදු කරන අතර තවදුරටත් අයවිය යුතු මුදල රු.75,000 කි. | *විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ශක්තිමත් කළයුතු බව.<br>*වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් මු.රෙ.156 (1) ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඉ) | රජයේ සේවයේ වැටුප් සංශෝධනය කරමින් 2006 අප්‍රේල් 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(IV) | ගොනුවල විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා ප්‍රමාණවත් තොරතුරු ඇතුළත්ව නොමැත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක වීමට පෙර විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය 2015 ජූලි 10 දින සිට ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වසර 7 ක් ගතවී ඇතත් විශ්‍රාම වැටුප් ගොනු 233 ක වැටුප් සංශෝධනය කර නොතිබුණි. | | |
| (ඊ) | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලබාගත් විශ්‍රාමිකයෙකුගේ මියගේ විශ්‍රාම වැටුප හා ඇයට හිමි වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප එම විශ්‍රාමිකයා මිය යාමෙන් පසු වසර 05 ක් පමණ කාලයක් සඳහා රු.2,696,304 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය වී තිබුණි. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 09/2014 මගින් ජීවිත සහතික ලබා නොදෙන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් තාවකාලිකව නතර කිරීමට කටයුතු නොකිරීම මත විශ්‍රාම ප්‍රතිලාභියා විසින් ජීවත් වීමේ සහතික ලබා දී නොතිබිය දී 2013 සිට 2016 දක්වා වූ වසර වලදී විශ්‍රාම වැටුප් අවිධිමත් ලෙස ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම හඳුනා ගත් වහාම ගෙවීම් අත්හිටුවා රු.250,000 ක් අයකරගෙන ඇත. මේ වන විට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඉදිරියේදී මෙම තත්වය වලක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | *විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ශක්තිමත් කළයුතු බව.<br>*වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් මු.රෙ.156 (1) ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු 11 ක් හඳුනා ගෙන තිබූ අතර ඒ් සඳහා ඉලක්ක 20 ක් හඳුනා ගෙන තිබුණි. සමාලෝචන වර්ෂය අවසාන වන විට එම ඉලක්ක ඉටුකර ගැනීමේ ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක 12 ක් සඳහා සියයට 0 සිට සියයට 49 ක් හා අපේක්ෂිත ඉලක්ක 03 ක් සඳහා සියයට 50 සිට සියයට 74 දක්වා ද ,ඉලක්ක 05 ක් සඳහා සියයට 75 සිට සියයට 100 අතර ප්‍රමාණයක පැවැතුණි. | 2023 වර්ෂයේ සිට අදාල අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය ඉහළ මට්ටමක් පවත්වාගෙන යාමට බලාපොරොත්තු වේ. | අයත්වන ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා අනුමත සේවකයන් 3,454 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 3,176 ක් වූයෙන් පුරප්පාඩු 279 ක් ද අතිරික්තය 1 ක් ද විය. | සෑම මසකම 15දින හා 30දින දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය මඟින් යාවත්කාලීන කරණු ලැබේ. | අදාල අත්‍යාවශය පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකායේ සේවකයින් 2763 ක් බඳවාගෙන තිබූ නමුදු, ඉන් සේවකයින් 950 ක් මේ වන විටත් ඉවත්ව ගොස් තිබූ බැවින් දැනට සේවයේ නියුක්තවන සේවකයින් 1813 දෙනෙකු ඵලදායී කාර්යකට යොදා නොගෙන 2022 වර්ෂයේ වැටුප් වශයෙන් රු.526,938 ,510 ක් ගෙවා තිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තියක් මත අදාල සේවකයින් බඳවාගෙන ඇති අතර , අදාල චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ගෙවීම් කටයුතු සිදුකර ඇත. | බහුකාර්ය සංවර්ධන නිලධාරීන් ඵලදායී කාර්යකට යොදාගතයුතු බව. |
| (ඇ) | 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/ 2001 ප්‍රකාරව සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් ස්ථාන මාරු සඳහා යටත්විය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 තුල කාර්යාලගත සංවර්ධන නිලධාරීන් 108 ද කළමනාකරණ සේවා නිලධාරීන් 117 ද ක්ෂේත්‍රගත සංවර්ධන නිලධාරීන් 791 ක් ද ක්ෂේත්‍රගත ග්‍රාමනිලධාරීන් 103 ක් ද වසර 5 කට වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කර තිබුණි . | අදාළ නිලධාරීන් පිළිබඳ වාර්ෂිකව අදාළ ආකෘති මගින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |